
# සත් බුදුරජාණන් වහන්සේලා



සංස්කරණය

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.**

**ඔබගේ නිවස සාංඝික දානයකට සූදානම් වෙනවාද ?**

**මෙම කරුණු හොඳින් පිළිපදින්න.**

(1) බය නැතිව වතුර දමා දෙපා සෝදන්න.

(2) වැසි වේලාවේදී සහ සීතල අවස්ථාවල උණුවතුර මිශ්‍ර කරන්න.

(3) දෙපා පිස දැමීම ඉක්මණින් කරන්න.

(4) දානය වැළදීමට පහසුවන ආකාරයට ආසන පහසුකම් සලසන්න.

(5) ඉතා ගෞරවයෙන් යුතුව බුද්ධ පූජාව සූදානම් කරන්න.

(6) තොවිල්, බලි පිදේනි වලට බෙදෙන ආකාරයට බුදුරජාණන් වහන්සේට දානය සූදානම් නොකළ යුතුයි.

(7) බුද්ධ පූජාව සහ සංඝයා වහන්සේලාට සූදානම් කර තබන දානය පුවත් පත් වලින් සහ මිනී ඔතන සැරසිලි කරන සුදු පොලිතීන් වලින් තොරව පිරිසිදු සුදු රෙදි වලින් වැසිය යුතුයි.

(8) සංඝයා වහන්සේලා දස නමකට වැඩිනම් මූලාසනාරූඪ ලොකු ස්වාමීන් වහන්සේට පළමුව බත් බෙදූ පසු තවත් පිරිසක් අනෙක් කෙළවරින් එයාකාරයටම දානය බෙදාගෙන ආයුතුයි.

(9) හිස් පිඟන්, කෝප්ප සහ වෙනත් භාජන පිළිගැන්වීම අගෞරවයකි.

(10) දානය බෙදන අතරතුර කථාබස් කිරීම අශෝභන ගතියකි. එසේ කථා කරන විට පසුපස දානය බෙදාගෙන එන දායකයන් පමණක් නොව ඉදිරියෙහි වැඩසිටින ස්වාමීන් වහන්සේලාද අපහසුවට පත් වෙති.

(11) කාන්තාවන් සංවර ඇඳුමකින් සිටීම ඉතා වැදගත්ය.

(12) තුප්පහි ඇඳුම් වලින් සිටීම පුණ්‍ය කටයුත්තකදී අශෝභන සිරිතකි.

(13) පිරිමි අයද තැනට සුදුසු ඇඳුමකින් සිටිය යුතු (මජන්ශුට්) වැඩ කරන ගමන් වගේ සිටීම, කටේ බුලත් කෙළ පුරවාගෙන සිටීම අශෝභනය.

(14) වතුර ගේන්න, පඩික්කම් ගේන්න කියා කෑ ගැසීම අශෝභනය.

# සත් බුදුරජාණන් වහන්සේලා

## අංක : 16

*සංස්කරණය*

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි.

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!**

ශ්‍රී බුද්ධ වර්ෂ 2550 ක් වූ වෙසක් පුර 2 වන කුජ දින

**ක්‍රිෘවර්ෂ 2008 - මැයි හය වන දින**

කහව ගල්දූව ශ්‍රී ගුණවර්ධණාරාම යෝගාශ්‍රමය

වර්තමානයේ බොහෝදෙනා හට ඉතා කාර්ය බහුලව වැඩ අධික ජීවත්වීමේ ප්‍රශ්න, සමාජ ප්‍රශ්න, ලෙඩ රෝග ප්‍රශ්න ආදී මෙකී නොකී **(අනෙතා ජටා බහි ජටා)** එකොළොස් ආකාරයක ගින්නකින් පිළිස්සෙමින් ජීවත්වීමට සිදුවී තිබේ. එසේ ජීවත් වෙන ගමන් ජරා, ව්‍යාධි, මරණයට නොනැවතී යන ගමනේදී නිරන්තරයෙන්ම සිතින්, කයින්, වචනයෙන් යන රැස්කරගන්නේ දුගතිගාමී වීමේ අකුසල්මය.

මොහොතක් සිතන්න. මෙතෙක් ආ ගමනේදී මටය, මගේය කියා අනුන්ට චිත්තපීඩා, කායික පීඩා නොදී මෙළොව පරළොව සතුටුවන දේවල් කරගෙන තිබේද ? වැඩිකොටසක් කරගෙන තිබෙන්නේ වැරදි වැඩයි. ඒවා සිහියට නැගෙන විට ක්‍ෂණයකින් අමතක කරදමා තමා නොකරණ ලද හොඳ දෙයක් පුණ පුණා කියවයි. සිතයි. සුළුවෙන් හෝ යම්කිසි පිණක් සිතට එකගව කරගන්නේ නම් එය අළුයට සැගවුන ගිනි අගුරුසේ සුදුසු අවස්ථාවට විපාක ලැබේ. එමනිසා තමන්ට විවේකයක් තිබෙන වේලාවක මෙම දහම් ග්‍රන්ථය කියවන්න. එවිට ඔබේ සිතට සීල, භාවනා, බුදු ගුණ, දහම් ගුණ, සඟ ගුණ, සසර දුක භිය අවබෝධ වෙයි. එම කුසලය පරලොවට ගෙනයන මඟ වියදමක් බවට පත්වෙයි. එයම තමාට පිළිසරණක් වේවායි පතමි.

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!**

අනේපිඩු සිටුතුමා විසින් පූජාකරණ ලද ජෙතවන විහාරයේ අපගේ ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේ වැඩවසන සමයෙහි එක් දිනක් බොහො' භික්ෂූන් වහන්සේලා ධර්ම සාකච්ඡාවක් පවත්වමින් සිටින

ස්ථානයට බුදුරජාණන් වහන්සේ පැමිණ මා මෙහි පැමිණීමට පෙර කුමණ දෙයක් සාකච්ඡා කරමින් සිටියේද ? යි අසා වදාළ සේක.

''ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ මෙහි පැමිණීමට පෙර අප විසින් ''පූර්වනිවාසය මෙසේ වේ, පූර්වනිවාසය මෙසේත් වේ'' යයි පූර්වනිවාස ප්‍රතිසංයුක්ත දැහැමි කථාවක් උපන. අපගේ මෙම අතුරු කථාව අඩාල විය. ස්වාමීන්වහන්සේ වැඩි සේකැයි '' පැවසූහ.

''මහණෙනි, තෙපි පෙරවූ දහම් සිද්ධියක් පිළිබඳ කථාවක් ඇසීමට කැමැතිද? දැයි' ඇසූසේක. ''භාග්‍යවතුන් වහන්ස අප කෙරෙහි කරුණාවෙන් එම භවයෙන් වැසුන අපට නොපෙණෙන ඔබ වහන්සේට පමණක් පෙනෙන එම දහම් සිද්ධිය වදාරණ සේක්වා, ඒ සඳහා මේ සුදුසු අවස්ථාවයි. අප මැනවින් සිහිතබා ගන්නෙමු'' යි ඉල්ලා සිටියහ. '' එසේ නම් අසවු, සිහිතබා ගනිව්. මෙනෙහි කරවු එය දේශනා කරන්නෙමි'' යි මතු දැක්වෙන ධර්ම කථා වස්තුව වදාළ සේක.

''මහණෙනි, මෙයට මහා කල්ප අනූඑකකට පෙර **''විපස්සි''** නමින් සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමක් ලෝ පහළ වූහ. ඉන්පසු මෙයින් මහා කල්ප තිස්එකකට පෙර **''සිඛී''** යන නමින් තවත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමක් ලෝ පහළ වූ සේක. එම කල්පයෙහිම **''වෙස්සභූ''** යන නමින් තවත් බුදුරජාණන් වහන්සේ නමක් ලෝ පහළ වූහ. ඉන්පසු මහණෙනි, මෙම කල්පයෙහි **''කකුසඳ'** නමින් සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමක් ලෝ පහළ වූහ. මහණෙනි, මෙම කල්පයෙහි දෙවන අතුරුකප **''කොණාගමන''** නමින් තවත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමක් ලෝ පහළ වූහ. ඉන්පසු තුන්වන අතුරුකප **''කාශ්‍යප''** නමින් තවත් බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළ වූහ. මහණෙනි, මෙම අතුරුකප සම්‍යක් සම්බුඬවූ මම මෙසමයෙහි ලොව පහළ වීමි.

''මහණෙනි, විපස්සී බුදුරජාණන් වහන්සේ ජාතියෙන් ක්‍ෂත්‍රිය වූහ. කැත්තුලයෙන් උපන්හ. එසේම සිඛී බුදුරජාණන් වහන්සේද, වෙස්සභූ බුදුරජාණන් වහන්සේද එම ජාති, කුලවල උපන්හ.'' මහණෙනි, මෙම කප

බුදුවූ කකුසඳ, කෝණාගම, කාශ්‍යප යන සම්බුදු රජාණන් වහන්සේලා ජාතියෙන් බ්‍රාහ්මණ වූහ. බමුණු කුලයෙහි උපන්හ. මහණෙනි, මෙකල් සම්‍යක් සම්බුඬවූ මම ජාතියෙන් ක්‍ෂත්‍රිය වීමි. කැත්කුලෙහි උපන්නෙමි.

''මහණෙනි, විපස්සී, සිඛී, වෙස්සභූ යන බුදුරජාණන් වහන්සේලා ගෝත්‍රයෙන් කොණ්ඩඤ්ඤ වූහ. මහණෙනි, කකුසඳ, කෝණාගමන, කාශ්‍යප සර්වඥයන් වහන්සේලා ගොත්‍රයෙන් කාශ්‍යප වූහ. මහණෙනි, මෙසමයෙහි සම්‍යක් සම්බුඬවූ මම ගොත්‍රයෙන් ගෞතම වෙමි. මහණෙනි, විපස්සී සර්වඥයන් වහන්සේගේ ආයු ප්‍රමාණය අවුරුදු අසූදහසකි. සිඛී බුදුරජාණන් වහන්සේගේ ආයු ප්‍රමාණය අවුරුදු හැත්තෑ දහසකි. වෙස්සභූ බුදුරජාණන් වහන්සේගේ ආයු ප්‍රමාණය හැටදහසකි. මහණෙනි, කකුසඳ බුදුරජාණන් වහන්සේගේ ආයු ප්‍රමාණය අවුරුදු හතලිස් දහසකි. කෝණාගමන බුදුරජාණන් වහන්සේගේ තිස්දහසකි. එසේම කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ ආයු ප්‍රමාණය අවුරුදු විසිදහසකි. මෙකල ලෝ පහළ වූ මාගේ ආයු ප්‍රමාණය ඉතා ස්වල්පය, අල්පය, මෙකල යමෙක් දීඝී කාලයක් ජීවත් වන්නේ නම් අවුරුදු සියයක් හෝ එයට ටිකක් වැඩි කාලයක් ජීවත් වන්නේය.

''මහණෙනි, විපස්සි බුදුරජාණන් වහන්සේ පලොල් රුකක් මුලදී සත්‍යාවබෝධය කළහ. සිඛී බුදුරජාණන් වහන්සේ හෙළඹ රුකක් මුල සත්‍යය අවබෝධ කරගත් සේක. වෙස්සභූ බුදුරජාණන් වහන්සේ සල්රුකක් මුල සත්‍යය අවබෝධ කරගත් සේක. මෙම කප බුද්ධත්වයට පත්වූ කකුසඳ බුදුරජාණන් වහන්සේ මහරී රුකක් මුල සත්‍යය අවබෝධ කරගත් සේත. කෝණාගමන බුදුරජාණන් වහන්සේ දිඹුල් රුකක් මුල සත්‍යාවබෝධය කරගත් සේක. කාශ්‍යප බුදුරජාණන් වහන්සේ නුග රුකක් මුල සත්‍යාවබෝධය කරගත් සේක. මෙකල සම්මා සම්බුද්ධත්වයට පත්වූ මම ඇසතු රුකක් මුල සත්‍යාවබෝධය කළෙමි.

''මහණෙනි, විපස්සී සර්වඥයන් වහන්සේට ඛණ්ඩය, තිස්ස යයි අගසව් දෙනමක් විය. සිඛී සර්වඥයන් වහන්සේට අභිභූය, සම්භව යැයි

අගසව් දෙනමක් විය. වෙස්සභූ සර්වඥයන් වහන්සේට සෝණය, උත්තර යයි අගසව් දෙනමක් විය. කකුසඳ සර්වඥයන් වහන්සේට විදුරය, සඤ්ජීව යයි අගසව් දෙනමක් වූහ. කෝණාගමන සර්වඥයන් වහන්සේට භියෙපාසය, උත්තර යයි දෙනමක් වූහ. කාශ්‍යප සර්වඥයන් වහන්සේට තිස්සය, භාරද්වාජ යයි අගසව් දෙනමක් විය. මෙකල සර්වඥතාඥාණයට පැමිණියා වූ මාහට සැරියුත්, මුගලන් නමින් අගසව් දෙනමක් වන්නේය.

''මහණෙනි, විපස්සි භාග්‍යවතුන් වහන්සේට ශ්‍රාවක සමාගම් තුනක් වූහ. එක් සමාගමක් භික්ෂූන් වහන්සේලා එක් ලක්ෂ හැට අටදහසක් වූහ. එක් සමාගමක් ලක්ෂයක් වූහ. අනෙක් සමාගම භික්ෂූන් වහන්සේලා අසූදහසකින් සමන්විත වූහ. මෙම සෑමදෙනාම රහත් භාවයට පත්වූ ශ්‍රාවකයන් වහන්සේලා වූහ.''

එසේම සිඛි භාග්‍යවතුන් වහන්සේටද ශ්‍රාවක සමාගම් තුනක් වූහ. එක් සමාගමක් භික්ෂූන් ලක්ෂයකින් සමන්විත වූහ. තව සමාගමක් භික්ෂූන් අසූදහසකින් සමන්විත වූහ. අනෙක් සමාගම හැත්තෑ දහසකින් සමන්විත වූහ. මෙම සමාගම් තුනෙහිම භික්ෂූන් රහත් භාවයට පත්වූ උත්තමයාණන් වහන්සේලාය.

''මහණෙනි, එසේම වෙස්සභූ භාග්‍යවතුන් වහන්සේටද ශ්‍රාවක සන්නිපාත තුනක් වූහ. එක් සමාගමක් අසූදහසකි. එක් සමාගමක් හැත්තෑදහසකි. එක් සමාගමක් මහණ භික්ෂූන් හැටදහසකින් සමන්විත වූහ. මේ සියළු දෙනාම රහත් භාවයට පත්වූ උත්තමයාණන් වහන්සේලාය.

කකුසඳ භාග්‍යවතුන් වහන්සේටද රහත් භාවයට පත්වූ හතළිස් දහසක එක් සංඝ සංනිපාතයක් වූහ. එසේම කෝණාගමන භාග්‍යවතුන් වහන්සේටද තිස්දහසක රහතන් වහන්සේලාගේ එක් සංනිපාතයක් වූහ. එසේම කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේටද විසිදහසක එක් සංඝ සන්නිපාතයක් වූහ. මෙකී සියළුම සංඝ සන්නිපාතයන්ම රහත් භාවයට පත්වූ උත්තමයාණන් වහන්සේලාමය. මහණෙනි, මේ සමයෙහි අතීත්

සම්‍යක් සම්බුඬවූ මා හට රහත් භාවයට පත්වූ භික්‍ෂූන් එක්දහස් දෙසීය පණහක් වූ එක් ශ්‍රාවක සන්නිපාතයක් විය.

''මහණෙනි, විපස්සී තථාගතයන් වහන්සේට ''අශෝක'' නමින් අග්‍ර උපස්ථායකයෙක් විය. සිඛී තථාගතයන් වහන්සේට ''මේධංකර'' නම් අග්‍ර උපස්ථායකයෙක් විය. වෙස්සභූ තථාගතයන් වහන්සේට ''උපසාන්ත'' නම් අග්‍ර උපස්ථායකයෙක් විය. කකුසඳ තථාගතයන් වහන්සේට ''බුද්ධිජ'' නම් උපස්ථායකයෙක් විය. කෝණාගමන තථාගතයන් වහන්සේට '' සොත්ථිජ'' නම් අග්‍ර උපස්ථායි තෙර නමක් විය. කාශ්‍යප තථාගතයන් වහන්සේට ''සබ්මිත්‍ර'' නමින් අග්‍ර උපස්ථාන මහණ භික්‍ෂූන් වහන්සේනමක් විය. මෙසමයෙහි මා හටද ''ආනන්ද' නමින් උපස්ථායකයෙක් වෙයි.''

''මහණෙනි, විපස්සී බුදුරජාණන් වහන්සේගේ පියාණන්ගේ නම ''බන්ධුමත්'' විය. මවගේ නම ''බන්ධුවතී'' නම් විය. බන්ධුමතී නම් නුවර විය. සිඛි බුදුරජාණන් වහන්සේට ''අරුණවතී'' නම් පියරජු විය. ''ප්‍රභාවතී'' නම් දේවිය මව විය. ''අරුණවතී'' නම් නුවර අරුණ රජුගේ රජදහන විය. වෙස්සභූ බුදුරජාණන් වහන්සේටද ''සුප්‍රතීත'' නම් රජතුමා පියාණන් විය. ''යශෝවතී'' නම් දේවිය මව විය. ''අනෝම නම් නුවර රජදහන විය. කකුසඳ බුදුරජාණන් වහන්සේගේ පියාණන් ''අග්ගිදත්ත'' නම් බමුණු විය. මවගේ නම ''විශාඛා'' නම් විය. එසමයෙහි ''ක්‍ෂෙම'' නම් රජ කෙනෙක් ''ක්‍ෂෙමවතී'' නුවර රජදහන බවට පත්විය. කෝණාගමන බුදුරජාණන් වහන්සේගේ පියා ''යඤ්ඤදත්ත'' නම් බමුණු කුළයෙහි උපන් කෙනෙක් විය. ''උත්තරා'' බැමිණිය මව විය. එසමයෙහි ''ශෝභාවතී'' නම් නුවර ''ශෝභා'' නම් රජ කෙනෙකුගේ පාලනය කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ පියා ''බ්‍රහ්මදත්ත'' නම් බමුණුතුමෙක් විය. මව ''ධනවි'' නම් බැමිණි කෙනෙක් විය. එකල බරණැස් නුවර ''කිකී'' නම් රජකෙනෙකුගේ පාලනය විය. මහණෙනි, මෙසමයෙහි සම්මා සම්බුද්ධත්වයට පත්වූ මාහට ''සුදෙධාදන'' රජ පියා විය. මව ''මායා'' දේවිය විය. කිඹුල්වත් නුවර රජදහන විය.''

අපගේ ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේ මෙසේ වදාරා හුනස්නෙන් නැගී වෙහෙරට වැඩි සේක. ඉන්පසු භික්ෂූන් වහන්සේලා අතර මෙසේ කථාවක් ඇති විය. අපගේ ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් පෙර විසූ භාග්‍යවතුන් වහන්සේලාගේ බුද්ධත්වයට පත් කාළ වකවානු, කුළ ගෝත්‍ර, ආයුෂ, පිරිවර, දෙමාපිය, රාජ්‍යත්භී නාම ආදී මෙතරම් දීර්ඝ කාලයක්, මෙතරම් විස්තරයක් කෙසේ දැන වදාරණ සේක්ද? කිසියම් දෙවි කෙනෙක්වත් බුදුරජාණන් වහන්සේට මෙකී විස්තර දන්වා සිටියේවත්ද? එම භික්ෂූන් අතර කථා විය. බුදුරජාණන් වහන්සේ සවස් වේලහි සමවතින් නැගී සිට කෙරෙරි මණ්ඩල මාලයට වැඩි සේක. එසේ වැඩ පඤ්ඤප්ති ආසනයෙහි වැඩ හිඳ භික්ෂූන් අමතා, ''මහණෙනි, තෙපි දැන් එක්ව කිනම් කථාවකින් හුන්නාදැයි?'' යි ඇසු සේක. එවිට එම භික්ෂූන් වහන්සේලා ''ස්වාමීනි, ඔබ වහන්සේ වැඩිය පසු අප අතර මෙවන් කථාවක් ඇති උනායැයි'' කථා බස් කළ තොරතුරු දන්වා සිටි සේක. මහණෙනි, යම් ධර්ම ධාතුවක් පිළිවිද බැවින් තථාගතයෝ එම බුදුරජාණන් වහන්සේලා මෙබඳු ජාති, නාම, ගෝත්‍ර, ශීල, ධර්ම, නුවණ, විහරණ, විමුක්ති ඇත්තොවූහයි සිඳලූ ප්‍රපඤ්චව ඇති, සිඳලූ කම්වැට ඇති, සෑම ලෙසින් ක්ෂීණ කළ කම්වැට ඇති සියලු විපාක දුක් ඉක්මවූ අතීත බුදුරජාණන් වහන්සේලා ජාති, නාම, ගෝත්‍ර, ආයුෂ, ප්‍රමාණ, ශ්‍රාවක යුග, ශ්‍රාවක සන්නිපාත විසින් සිහිකරන්නාහු නම් එම ධර්ම ධාතුව තාථගතයන්ට සැල කළහ. ''මහණෙනි, තෙපි තවදුරටත් එකී බුදුරජාණන් වහන්සේලා පිළිබඳ සවිස්තරව දැන ගැනීමට කැමතිද? යි අසා වදාළ සේක.

''එසේය, ස්වාමීනි, එයට සුදුසු කාලය මෙයයි. එය අසා දැන ගැනීමටත්, සිහියෙ තබා ගැනීමටත් කැමැත්තෙමුයි'' දන්වා සිටි සේක. එවිට බුදුරජාණන් වහන්සේ ''මහණෙනි, එකල්හි විපස්සී බෝසතාණන් වහන්සේ තුසිත දිව්‍යලෝකයෙන් චුතව මව්කුස පිළිසඳ ගත් සේක'' මහණෙනි, මෙම ධර්මතාවය යම් කලෙක බෝසත්හු තුසී දෙව් නිකායෙන් මව්කුස පිළිසිඳ ගන්නාහු නම්, එකල දෙවියන් සහිත, මරුන් සහිත බඹුන් සහිත ලොවෙහි මහණ බමුණන් සහිත සත්ව ප්‍රජායෙහි දෙවියන්ගේ දේවානුභාව ඉක්මවා අපමණ වූ මහත් ආලෝකයක් පහළ වෙයි.

නිති විවෘරුණු, නොහුවුරුණු (යටින් පිහිටක් නැති) දැස් අඳුරු කරණ ගණඳුරු ඇති යම් ලෝ ඇඳිරි නිරයෝ වෙත්ද, මේසා මහ ඉදුනු ඇති මේසා මහ තෙදැති සඳ ඉරු ඒ යම් තැනක සිය ආලෝකයෙන් අඳුර දුරලන්නට නොහැක්කේද එහි පවා දෙවියන්ගේ දේව ආලෝකය ඉක්මවා අපමණවූ මහත් ආලෝකයක් පහළ වෙයි.

එහි යම් සත්ව කෙනෙක් උපන්නේද ඔහු එම එළියෙන් භවන්ති මෙහි ඉපනුදු තවත් සත්වයෝ ඇතැයි එම එළියෙන් ඔවුනොවුන් හඳුනා ගනී. මේ දස දහසක් ලෝකයන් අද හාත්පසින් සැලෙයි. වෙව්ලයි. දෙවියන්ගේ දේවානුභාවය ඉක්මවා අප්‍රමාණ වූ විපුල ආලෝකයක් ලොව පහළ වෙයි. එය ස්වභාව ධර්මයයි. ''මහණෙනි, යම් දවසක බෝසත් උතුමෙක් බුදුබවට පත්වන අන්තිම ආත්ම භාවයෙහිදි මව් කුසට ඇතුළු වූ අවස්ථාවේදී සතර වරම් දෙවියෝ එම බෝසත් උතුමන්ගේ මවගේ ආරක්ෂාව පිණිස සතර දිසාවට රැකවරණය දෙන්නේය. එයද ලෝ ධර්මතාවයයි. එසේම බෝසත් උතුමන් මව් කුසට ඇතුළු වූ අවස්ථාවේ පටන් එම මව නිසි පන්සිල් ආරක්ෂා කරන්නේය. එයත් ලෝක ධර්මතාවයයි. මවට කිසිම කාමරාග සිතිවිල්ලක් පහළ නොවෙයි. කිසිම පුද්ගලයකුට බෝසත් මව ඉක්මවිය නොහැක. බ්‍රහ්මචාරී වෙයි. මෙයත් ලෝක ධර්මතාවයකි.''

''මහණෙනි, මෙයත් එක් ලෝක ධර්මතාවයකි. එම බෝසතාණන් වහන්සේ මව් කුස පිළිසඳගත් මොහොතේ පටන් මවට කිසිම ආබාධයක් නොඋපදී බෝසත් මව නිදුක්, නීරෝගී, සුවපත් භාවයෙන් යුතුව තම අඟ පසඟ ඇතිව සිටින තම පුතු දකී. එම පුතු බිහිකල සත්වන දවසෙ මව කළුරිය කොට තුසිත දෙව්ලොව මහෙශාක්‍ය දිව්‍ය පුත්‍රයෙක්ව උපදී. එයත් ලෝක ධර්මතාවයකි. මහණෙනි, යම් සේ අන් ස්ත්‍රීහු නවමසක් හෝ දසමසක් කුසින් ගැබ රැක බිහිකරත්ද, බෝසත් මව විසින් බෝසතුන් ප්‍රසූත නොකරයි. පුරා දසමාසයක් බෝසත් කුමාරයා කුසදරා ප්‍රසූත කරයි. එයත් ලෝක ධර්මතාවයකි.''

මෙයත් ලෝක ධර්මතාවයකි. බෝසත් මව වෙනත් මව්වරුන් නොව සිටියදීම පුතු බිහිකරයි. එසේ බිහිවූ පුතු පළමුව දෙවියෝද, දෙවනුව මනුෂ්‍යයෝද පිළිගනිති. මව්කුසින් බිහිවූ කුමරු පොළවට පය නොතබත්, සතර වරම් දෙවියන් විසින් පිළිගෙන මවට පෙනී සිටීමෙන් මෙසේ කියයි. '' දේවියනි, සතුටු වන්න, ඔබතුමියට මහා බලසම්පන්න පුත්‍ර රත්නයක් උපන්හ. සතුටුවන්නැයි'' පවසා මවට කුමාරයා පෙන්වයි. මෙයත් ලෝක ධර්මතාවයකි.

''මහණෙනි, බෝසත් කුමරු මව් කුසින් බිහිවීමේදී විශදවැම දියෙන් නොවැකුනෙ, සෙමින් නොවැකුණෙ, ලෙයින් නොවැකුණේ, අසූචියකින් නොවැකුණේ පිරිසිදුව නිර්මලව බිහිවෙයි. මෙයත් ලෝක ධර්මතාවයකි. එසේ වන්නේ කසී සළුවලින් මිණි රුවනෙහි නොරුවතරේද, ඒ කිනම් කාරණයක් නිසාද යත් එම දෙකම ඉතා පිරිසිදු නිසාය. බෝසත් කුමරුන් මවත් එසේම පිරිසිදුයි. එයත් ලෝක ධර්මතාවයකි. ''මහණෙනි, බෝසත් මවට සහ කුමරුට දියපැන් පිණිස අහසින් සිසිල් සහ උණුපැන් දහර දෙකක් පහළ වේ. උපන් නොබෝ සැණින් දෙව් සේසත් දරනු ලබත්ම කුමාරයාගේ ශ්‍රී පත්ම යුග සමව පොළෙවෙහි පිහිටා උතුරු දෙසට මුහුණලා සත්පියවරක් යති. සෑම දිසාවත්ම බලති.

බෝසත් උතුමාණන් වහන්සේ නමක් මව් කුසින් බිහිවූ වහාම සියළුම දිව්‍ය, මාර, බ්‍රහ්මයන්ගේ ආලෝකයද, ඉරු, සඳු ආලෝකයද යටපත්කර අති මහත් ආලෝකයක් පහළ වෙයි. එම ආලෝකයේ බලයෙන් යට අවීචිමහ නිරයෙහි පටන් භවාග්‍රය දක්වාද, අන්ධකාරයේ බලයෙන් දැස් පැලී යන ලෝකාන්තරික නිරයටද එම ආලෝකය ලැබීමෙන් එහි වසන සත්වයෝ එකාට එකා දකිමින් මෙම නිරයෙහි මම පමණක් නොව තවත් සත්වයන් ඇතැයි දැන ගනිති. එම ආලෝකය දස දහසක් සක්වල පුරා පැතිරෙයි. මෙයත් ලෝක ධර්මතාවයකි.

විපස්සී බෝසත් කුමරුන් උපන් වේලෙහි ''දේවයනි, ඔබට පුත්‍ර රත්නයක් ලැබිණ, දේවයන් වහන්ස පුත්‍ර රත්නය දකින සේක්වායි'' බන්ධුමත් රජතුමාට දැන්වූහ. එවිට රජතුමා කුමරු දැක අපමණ සතුටට පත්ව නිමිති පාඨක බමුණන් ගෙන්වා කුමරු පෙන්වා නිමිති විමසීය. බමුණන් කුමරුගේ දෙපා ලක්ෂණ බලා මහත් සතුටට පත්ව මෙසේ පැවසීය. මහ රජතුමනි, සතුටු වන්න, ඔබ වහන්සේට මහත් යාග, කීර්තිමත් පුත්‍ර රත්නයක් ලැබිණ. මහ රජතුමනි, ඔබ වහන්සේගේ කුළයෙහි මෙවන් පුත්‍ර රත්නයක් උපන්නද ඔබතුමා ලද මහත් ලාභයකි. මෙම කුමරු දෙතිස්මහා පුරුෂ ලක්ෂණයෙන් සමන්විතයි. මෙම කුමරු ගිහිගෙයි සිටියොත් සතර මහා සාගරය සහිත මෙම මිහිකතටම අධිපති වන්නේය. ඕනෑම සතුරු බලයක් මැඩලිය හැකි සත්රුවණින් අධිපති දසරාජ ධර්මයෙන් පාලනය කරන සක්විති රජෙක් වන්නේය. චක්‍රරත්නය, හස්ති රත්නය, අශ්ව රත්නය, මණී රත්නය, ස්ත්‍රී රත්නය, ගණපති රත්නය, පරිනායක රත්නය මෙම සත්රුවන් වලට අධිපතිය.

මෙම කුමරුට ශූරවූ වීර්‍ය්‍යමයවූ සතුරු බල සේනා මැඩලීමට හැකි දහසකට වැඩි පුත්‍ර රත්නයක් හිමිය. මේ මහා පොළෝ තලයටම මේ කුමරුගේ අනසකට යටත්ව ධර්මයෙන් දිනා දසරාජ ධර්මයෙන් රාජ්‍යය කරන්නේය. එසේම මෙකුමරු ගිහිගෙයින් නික්ම පැවදි භාවයට පත්වුවහොත් ඒකාන්තයෙන්ම සම්මා සම්බුද්ධත්වයට පත්වන්නේය. රජතුමා එපවත් අසා සතුටට පත්ව බමුණන්ට දියයුතු දෑ දී යවා කුමරුගේ සියළු කටයුතු සඳහා කිරි මව්වරුන් පත්කර සැප සම්පත් සපයමින් ආරක්ෂා කලේය. කුමරුද සෑම කෙනෙකුටම ප්‍රියමනාප විය. කිරි මව්වරු එක් එක්කෙනා ඇකයෙන් ඇකයට මාරුකර ගනිමින් සුරතල් කරයි. මෙම කුමරුගේ කටහඬ ඉතා මිහිරි ජනකය. කුමරුට දිවා රෑ දෙකෙහිම යොදුනක් දුර එකසේ පෙණෙන කර්ම විපාක දිවසක් පහළ වී තිබුණි.

''එසේම මහණෙනි, මෙම කුමරු උපන් වේලේ පටන් තව්තිසා දෙවියන් මෙන් ඇසිපිය නොහෙලා බලන නිසා විපස්සී යයි නාමය උපන්හ. මහණෙනි, බන්ධුමතී රජතුමා විනිශ්චය සභාවෙහි විපස්සි, කුමරු ඇකයෙහි හුන්නේ විමස විමසා න්‍යායයෙන් අරත් ලෙස යුක්ති අරුත් (දනී, දකී) පවත්වයි. කුමරු තෙම න්‍යායයෙන් විමස විමසා අරුත් පවත්වා යැයි කියාම කුමරුහට වැඩි වැඩියෙන් විපස්සී, විපස්සි යයි කියාම සංඥාව උපන. කුමරුට ඍතු තුනට සරිලන මාළිගා තුනක් සාදවා සීත ඍතුවට තිබෙන මාළිගාවේ සියළු කටයුතු සඳහා ස්ත්‍රීන් පමණක්ම පත්කරන ලදී. උඩුමහළින් පහතට බැසීමටවත් නොදී උවටැන් කරයි. මෙසේ අවුරුදු දහස් ගණනක් ගෙවීයන කල්හී එක් දිනක් උයන් කෙළියට යාම සඳහා රියදුරුට සුදුසු වාහනයක් පිළියෙල කරන ලෙස දැන්වීය. ඒ අනුව වාහනයක් සූදානම් කර කුමරුට දැන්වීය.

''මහණෙනි, ඉක්බිති විපස්සි කුමරු ''භද්‍ර'' වූ යානයක නැගී එවන් තවත් යානා පිරිවරා උයන් බිම බලා නික්මුනි. මෙසේ උයන් කෙළි සඳහා යන අතරමගදී තුන්කුදු ගැසුනු හැරමිටිට ආධාර කොට වෙව්ලමින් යන ජරාතුරවූ වයසට පත් මිනිසෙක් දුටු සේක. එවිට රියදුරු අමතා ''යහළුව, මොහු කුමක් කරනු ලබත්ද? මොහුගේ හිසකෙස් අන් අයගේ මෙන් නොවේ. අන් අයගේ ශරීරියට වඩා වෙනස් ශරීරයක් මොහුට තිබෙන්නේ ඒ මන්ද?'' යි විමසීය. ''දේවයිනි, මොහු ජරාපත් වයසට පැමිණ සිටින කෙනෙකි'' ''යහළුව, මේ ජරාපත් වයස නම් කුමක්ද?'' ''දේවයිනි, මොහු තව වැඩි කාලයක් ජීවත් නොවෙයි'' ''එසේනම් යහළුව, මෙම තත්වය මටත් මෙසේම වෙයිද?'' ''එසේය, දේවයිනි, මෙම තත්වය උපදින සෑම සත්වයෙකුටම පොදුයි. මෙම තත්වයෙන් මිදෙන්නට කිසිවෙකුටවත් නොහැක්කේය. එය ලෝක ධර්මතාවයයි.'' ''එසේ නම් යහළුව, දැන් උයන් ගමන් වලින් වැඩක් නෑ ආපසු යමු'' යී කී සේක. කුමරුගේ සිතට මෙය වදදෙන්නට පටන් ගත්තේය. ආපසු ගොස් මේ ඉපදීම නිසයි වයසට යන්නේ මරණයට පත්වන්නේ, එසේ නම් ඉපදීම ශාපයක් වේවා යී .සිතීය.

ඉන්පසු පිය රජතුමා රියදුරු කැඳවා ම පුතුණුවන් උයන් බිම සතුටින් ගතකලාදැයි අසා සිටිවේලෙහි අතර මඟදී දුටු ජරාජීර්ණ මහළු රූපය දුටු වේලේ සිට බලවත් කනස්සල්ලෙන් සිටින බැව් දන්වා සිටි කල්හී, ම පුතුණුවන්  දුක් විඳින බුදුබවට පත් නොවේවායි නැකැත් බමුණන් කී ලෙසට තව තවත් ගිහි බන්ධන වැඩිකර තබා ගැනීමට මහත් වෙහෙසක් දරූ නමුත් තවත් බොහෝ කාලයක් ගෙවී ගිය පසු නැවතත් රියදුරු ගෙන්වා උයන් කෙළි යාමට අවශ්‍ය බැව් විපස්සි කුමරු දන්වා සුදුසු රථයක් සූදානම් කරන ලෙස දැන්වූ සේක.

''මහණෙනි, ඉන්පසු සරසන ලද යානයක නැගී සපිරිවරින් පිරිවර යානාත් සමඟ නික්මුන සේක. මෙසේ යන විට බොහෝ සේ රෝගාතුර වූ මනුෂ්‍යයකු මළ මුත්‍රා කිරීමටවත් බැරිව වැතිර සිටින අයුරුත් වෙනත් අයකුගේ උපකාරයෙන් අපහසුවෙන් සිටිනු දැක රියදුරු අමතා ''යහළුව, මේ කුමන මනුෂයෙක්ද? මොහුට මෙසේ වී තිබෙන්නේ කෙසේද?'' ''දේවයිනි, මොහු රෝගියෙක් මොහු මෙම අසනීපයෙන් මිදෙන්න උත්සහ කරන කෙනෙක් ''යයි කීහ. ''යහළු, සැරිය, මෙසේ ලෙඩවීම මටත් ඇතිවෙනවාද?'' ''දේවයිනි, ලෙඩවීම උපන් සෑම සත්වයෙකුටම පොදුයි. එයින් මිදෙන එකම සත්වයකුදු නැත. එය ඔබවහන්සේට කියා විශේෂයක් නැත'' යි කීහ. '' එසේ නම් යහළු සැරිය, මට උයන් කොළියෙන් කම් නැත. රථය ආපසු හරවා ගන්නැ'' යි කී සේක. එසේ කී ආකාරයටම ආපසු කුමරු මාළිගාවට පැමිණ හුදකලාව මෙසේ සිතන්නට විය. මේ ඉපදීමෙන් වයසට යාමත්, ලෙඩ රෝග වලට ගොඳුරු වීමත් වන්නේ නම් ඉපදීමට නින්දා වේවා, ඉපදීම මහා දුකකැයි සිතමින් විසීය.

නැවතත් පිය රජතුමා රථාචාර්‍ය්‍යා කැඳවා සියළු තොරතුරු දැන කෙසේ හෝ කුමරු බුදුවීමට යාමෙන් වළක්වා ගැනීම සඳහා තව තවත් කාම බන්ධනයෙන් බඳවා තබා ගැනීම පිණිස මහත් වෙහෙසක් දරමින් නොයෙක් ආකාරයේ පස්කම් සැප කුමරුට සපයමින් ක්‍රියා කලත්, තවත් දීර්ඝ කාලයකට පසු විපස්සි කුමරු හට උයන් කෙළි යාමට සිතක් පහළ වී ඒ බැව් රථාචාර්‍ය්‍යයාට දන්වා සුදුසු වාහනයක් ගෙන්වා ගෙන  සපිරිවරින්

උයන් කෙළියට යාමට පෙර පිය රජතුමා මාර්ගය දෙපස විශාල රාජ භට පිරිස් තබා සතර පෙරනිමිති නොදකින්න සැළැස්වූහ. ඒ කෙසේ වෙතත් දෙවියන් විසින් නියම අවස්ථාවට නියම ස්ථානයේදී කුමරුට පෙන්විය යුතු පෙරනිමිත්ත පෙන්වයි.

තුන්වන වරටද බොහෝ ආරක්‍ෂක භටයන්ගේ රැකවල් මැද කුමරු උයන් කෙළියට යන අතරමඟදී කුමරුට සහ රථාචාර්‍ය්‍යවරයාට පමණක් පෙනෙන ලෙසට අවමඟුල් පෙරහරකින් මළමිනියක් අවසන් කටයුතු සඳහා රැගෙන යන දර්ශනය දැක රථය ඒ දෙසට පදවන ලෙසට නියෝග කර ඊට ලංවූ පසු රියදුරාගෙන් සියළු විස්තර දැන, දැක මහත් දුකට පත්ව '' යහළු සැරිය, මේ මරණය යනු කුමක්ද?'' යි විමසීය. ''දේවයිනි, දැන් මේ මළ මිනිසාට කිසිම ඥාති, මිත්‍රයෙක් නැත. මරණකරුගේ සහ ලේ නෑ හිතවතුන්ගෙනුත් වෙන්වී සිටියි. පඤ්ච ඉන්ද්‍රියම ක්‍රියා විරහිතයි. මේ වන විට මේ ශරීරයේ පවත්නා තේජෝ, වායෝ ධාතු කොටස් පවා ඉවත්වයි තිබෙන්නේ ඉතිරි ආපෝ, පඨවි ධාතුන් දුගඳ හමන ඕජස් වශයෙන් ගලාගොස් පඨවි ධාතුව මහ පොළොවේ පස්වන බවට පත්වූ පසු කිසිවක් නැති, සිටපු කිසිවෙක් නැති බවට පත්වන්නේ යයි''කීහ. නැවතද උයන් කෙළි ගමන් නවතා ආපසු මාළිගාවට පැමිණි සේක.

''මහණෙනි, විපස්සි කුමරු මාළිගාවට වැඩියේ මරණය මට ඇතිවුවත්, පිය රජතුමාට ඇතිවුවත් ඔවුනොවුන් දකින්නේ නැතිනම්, කථා බස් කරන්නේ නැත්නම් මෙම ඉපදීම ඉපදීම මහත් ශාපයකැයි සිතමින්, දුකයැයි සිතමින්, මහත් ශෝකයෙන් පසුවිය. උපදින සත්වයාට ජාති, ජරා, ව්‍යාධි, මරණය ගෙනදෙන්නේ නම් මෙම ඉපදීමට ශාප වේවා යි පැතීය. මෙසේ කාළය කෙමෙන් ගෙවී යාමේදී බුද්ධත්වයට සුදුසු කාලය කෙමෙන් කෙමෙන් ලංවන්නේය. මේ වන විට විපස්සි කුමරුට සසර කළ කිරීමට උවමනා සත්‍ය කරුණු තුනක් එනම් ඃ- ජරා, ව්‍යාධි, මරණ තුනම දෙවියන් විසින් පෙන්වා දී අවසානයි. තව තිබෙන්නේ පැවදි රූප දර්ශනයත් පෙන්වීම පමණයි. එයටද අවස්ථාව උදාවිය.

නැවතත් කුමරුට උයන් කෙළි යාමට සිතක් පහළවී එබැව් රථාචයෝ්‍යවරයාට දන්වා මහ පෙරහරකින් උයන් කෙළි පිණිස පිටත්වී ටික දුරක් යාමේදී මෙවන් දර්ශණයක් පෙණින. හිස මුඩු පැවිදි වූ කසාවත් සිවුරක් දරාගෙන ඉතා සාන්ත සංවර ගමනකින් යන උත්තමයෙක් දුටුහ. ඒ දුටු කුමරු ''යහළු සැරිය, මේ මුනුෂ්‍යයා සෙසු මිනිසුන්ගෙන් වෙනස් ගති, පැවතුම් ඇතිව සිටින්නේ මොන හේතුවක් නිසාද?'' ''දේවයිනි, මෙතුමා උතුම් පැවිද්දෙන් සම්පූර්ණ වූ කෙනෙකි. මෙම ලක්‍ෂණ මහණදම් පුරණ උත්තමයින්ගේ චාරිත්‍ර සීලයකි.'' යී කීවේය. ''යහළු සැරිය, මහණදම් පුරණු යනු කුමක්ද?'' ''දේවයිනි, මෙතෙම ගුණදම් පුරණු මැනව, කෙළෙසුන් සංසිඳුවනු මැනව, කුසල් කරනු මැනව, අවිහිංසාවාදි වෙනු මැනව, පඤ්චකාම සම්පත් වලින් වෙන්වෙනු මැනව, යි සිතා එය දියුණු කරණු පිණිස පැවදි බවට පත්වී සිටියි'' යහළු සැරිය, එම පැවැත්ම ඉතා අගනේයි. සත්ව කරුණාව, අවිංහිසාව ඉතා අගනේයි. ඔහු වෙත රිය පදවන්න'' යි වදාළ සේක.

''මහණෙනි, එම පැවිද්දා වෙත ලංවූ විපස්සි කුමරු ''යහළුව, ඔබ මොනවාද කරන්නේ? ඔබ අන් අයගෙන් වෙනස් පැවැත්මක් ඇතිව සිටින්නේ මොන හේතුවක් නිසාද?'' ''දේවයිනි, මම පැවැදිදෙක් වෙමි. මම පැවිදි වූයේ ධර්මානුකූල ජීවිතයක් සහ කුශල ක්‍රියාව යහපත් නිසාත්, අවිහිංසාවාදිත්වයක්, සත්වානු කම්පාවත් උතුම් බව අරමුණු කරගෙන පැවිදි වූයෙමි. එවිට කුමරු පින්වත, ඔබේ මේ සිතිවිලි ඉතා අගනේය, ඉතා උතුම් අරමුණු ඇතිව පැවිදිවීම යහපත් යැයි'' වදාල සේක. ඉන් පසු රියදුරු අමතා ''යහළු සැරිය, මම මෙහිම නැවතී මහණදම් පුරමි. තෙපි මෙම රථය ආපසු ගෙන යන්න'' යි දන්වා සිටිසේක.

''මහණෙනි, ඉන්පසු විපස්සි කුමරු එහිම කෙස් රැවුල් බා ගිහිගෙයින් පැවදි භාවයට පත්වූ සේක. එම පුවත බන්‍ධුමතී රජදහන පුරා සුළු කාලයක් ඇතුලත පැතිර ගියේය. එම පුවත අසුභාරදහසක් පමණ ජනමුළුවත් අපගේ විපස්සි කුමරු එසේ කලානම්, එහි යම් විශේෂ අර්ථයක් ඇත. එම දහම් මඟ සුළු පටු දෙයක් නොවේ. පැවිදි භාවය බොහෝ බල

සම්පන්න විය යුතුයි. ඒසා මහේශාක්‍ය රාජකුමාරයෙක් දිව්‍ය සම්පත් සමාන පඤ්චකාම සැප හැරදමා පැවිදි වූවානම් අපි අප ගැන කිනම් කථාද? යි සිතා කුමරු අනුවම පැවිදි භාවයට පත්ව ගම් නියම් ගම්, රජදහන්හි සැරසරමින් සත්ව ඝාතනය ආදී පස්පවු අකුසල් වලින් මිදීමට අනුශාසනා කරමින් සැරසැරූහ.

''මහණෙනි, විපස්සි කුමරුට මෙවන් සිතක් පහළ වූහ. මම මෙම පිරිස සමඟ සිටීම නොවටී, හුදකලා විය යුතුයි. සිතා එම අදහස පිරිසට දන්වා ඔවුන් වෙනත්, වෙනත් ස්ථානවලට ගොස් බෝසත් කුමරු හුදකලා වූ සේක. ඉන්පසු මෙම බෝසත් උතුමා චිත්ත විවේකයෙන් රැයක් ගත කිරීමට බෝ මැඩට පිටදී සිටියදී මෙවන් සිතක් පහළ වූ, අහෝ දුකකි, මෙම ලෝක සත්වයා උපදිනවා, දිරනවා, ලෙඩ රෝග වලට ගොදුරු වෙනවා, මරණයට පත්වෙනවා, එසේම මැරුණත් නැවත නැවත ඉපදී නැවත, නැවත මෙම තත්වයටම පත්වූවත් එය මෙම සත්වයාට නොපෙනේ, නොතේරේ, නොදනී, කවදා මෙම දුක්ඛයාගේ ජරා, මරණ දෙක්හි නිසරණය දකීද? මෙකී සිතිවිල්ල ඇතිවූ සේක.

''මහණෙනි, එකල්හි බෝසතාණන් වහන්සේට කුමක් ඇති කල ජරා, මරණ වේද? කුමණ හේතුවක් නිසා ජරා, මරණ වේදැයි මෙවන් සිතක් පහළ වූ සේක.'' ''මහණෙනි, ඉක්බිති බෝසතාණන් වහන්සේට ඉපදීම නිසා ජරා මරණය වෙයි. ජාති ප්‍රත්‍යයෙන් ජරා මරණය වේ'' යයි උපාය මනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය. අවබෝධ විය. ඉන් අනතුරුව බෝසතාණන් වහන්සේට කුමක් ඇති කල්හි ඉපදීම (ජාතිය) වේද, කුමන පසයෙන් ජාතිය වේදැයි මේ සිත විය. ඉන්පසු භවය ඇති කල්හි ජාතිය වේ. භව ප්‍රත්‍යයෙන් ජාතිය වේයයි යොනිසෝ මනසිකාරයෙන් ප්‍රඥාභිසමය විය.

ඉන්පසු මෙවන් සිතක් පහළ වූ සේක. කුමක් ඇතිකල්හි භවය වේද, කුමන ප්‍රත්‍යයෙන් භාවය වේදැයි යන සිත උපාදානය (දැඩි ලෙස ගැනීම) අති කල්හි භාවය වේ. උපාදනය ප්‍රත්‍යයෙන් භාවය වේ.

ප්‍රඥාභිසමය ඇතිවිය. ''මහණෙනි, ඉක්බිති බෝසතාණන් වහන්සේට කුමක් ඇති කල්හි උපාදානය වේද? කුමණ ප්‍රත්‍යයෙන් උපාදානය වේදයි මෙවන් සිතක් ඇති විය. තෘෂ්ණාව ඇති කල්හි උපාදානය වේ. ප්‍රඥාභිසමය ඇති විය. මහණෙනි, ඉන්පසු විපස්සි බොසතාණන් වහන්සේට කුමක් ඇති කල්හි තෘෂ්ණාව වේද, කුමන ප්‍රත්‍යයෙන්, කුමන තෘෂ්ණාවෙන් වේදැයි මෙවන් සිතක් පහළ විය. වේදනාව ඇති කල්හි තෘෂ්ණාව වේ. වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ, යැයි යොනිසො මනසිකාරයෙන් ප්‍රඥාභිසමය විය. මහණෙනි, ඉක්බිති බෝසතාණන් වහන්සේට කුමක් ඇති කල්හි වේදනාව වේද? කුමණ ප්‍රත්‍යයෙන් වේදනාව වේදැයි මෙවන් සිතක් ඇතිවිය. එකල්හි සප්ශීය ඇති කල්හි වේදනාව වේ. සප්ශී ප්‍රත්‍යයෙන් වේදනාව වේ, යැයි යොනිසො මනසිකාරයෙන් ප්‍රඥාභිසමය විය. කුමක් ඇති කල්හි සප්ශීය වේද, කුමණ ප්‍රත්‍යයෙන් ස්පශී වේදැයි මෙම සිත උපන. මහණෙනි, එකල්හි බොසතාණන් වහන්සේට ෂඩායතනය ( ආයතන හය) ඇති කල්හි ස්පශී වේ. ෂඩායතන ස්පශී වේ යයි යොනිසො මනස්කාරයෙන් ප්‍රඥාභිසමය විය.

ඉක්බිති විපස්සි බොසතාණන් වහන්සේ කුමක් ඇති කල්හි ෂඩායතනය වේද, කිමෙක ප්‍රත්‍යයෙන් ෂඩායතනය වේදැයි මෙම සිත උපන්හ. එකල්හි බෝසතාණන් වහන්සේට නාම රූපය ඇති කල්හි ෂඩායතනය වේ. නාම රූපයෙන් ෂඩායතනය වේ යැයි යොනිසො මනසිකාරයෙන් ප්‍රඥාභිසමය විය. මහණෙනි, ඉන්පසු බොසතාණන් වහන්සේට කුමක් ඇති කල්හි නාමරූපය වේද, කිමෙක ප්‍රත්‍යයෙන් නාම රූපය වේදැයි මෙවන් සිතක් ඇති විය. එවිට බොසතාණන් වහන්සේට විඥානය ඇති කල්හි නාම රූපය වේ. විඥාන ප්‍රත්‍යයෙන් නාම රූපය වේ, යැයි ප්‍රඥාභිසමය විය. කුමක් ඇති කල්හි විඥානය වේද, කිමෙක ප්‍රත්‍යයෙන් විඥානය වේද යි මෙවන් සිතක් විය. මහණෙනි, එකල්හි බෝසතාණන් වහන්සේට නාම රූපය ඇති කල්හි විඥානය වේ. නාම රූපය ප්‍රත්‍යයෙන් විඥානය වේ, යයි යොනිසො මනසිකාරයෙන් ප්‍රඥාභිසමය විය.

මහණෙනි, එකල්හි බොසතාණන් වහන්සේට මේ විඥානය පෙරලා නවතීමය, නාම රූප දෙකින් බැහැරට නොයයි, මෙතනින් උපදෙන හෝ දිරණුයේ හෝ මිය යනු නොවේ, හෝ චුතවන්නේ හෝ නැවත උපදිනුයෙ හෝ මේනම් නාම රූප ප්‍රත්‍යයෙන් ෂඩායතනය වේ. ෂඩායතන ප්‍රත්‍යයෙන් (ප්‍රත්‍යයෙන්....................) සපශ් වේ. සපශ් ප්‍රත්‍යයෙන් වේදනාව වේ. වේදනා ප්‍රත්‍යයෙන් තෘෂ්ණාව වේ. තෘෂ්ණා ප්‍රත්‍යයෙන් උපාදනය (අල්ලා ගැනීම) වේ. උපාදන ප්‍රත්‍යයෙන් භාවය (.........) භව ප්‍රත්‍යයෙන් ජාතිය වේ. (මිනිස් තිරිසන් ආදී) ජාති ප්‍රත්‍යයෙන් ජරා, මරණ, ශෝඛ පරිදේවද, (.............) දුක්, දොම්නස් උපායාසයෝද (......) පහළ වේත්, මෙසේ මේ සියළු දුක් ගොඩේ ඉපදීම වේ, යැයි මෙම සිත පහළ විය. ආලෝකය පහළ විය. ඉන්පසු කුමක් නැතිකල ජරා මරණ නොවේද. කිමක නිරෝධයෙන් (නැති කල විට) ජරා මරණ නිරෝධය වේදූයි සිත වේදූයි සිත විය. මහණෙනි, ඉක්බිත්තෙන් බෝසතාණන් වහන්සේට ජාතිය නැති කල (උප්පත්තිය) ජරා මරණය නොවේ. ජාති නිරෝධයෙන් (නිවැරදි දැක්ම) ප්‍රඥාභිසමය විය. ඉක්බිති බෝසතාණන් වහන්සේට කුමක් නැති කල ජාතිය නොවේද, කුමක නිරෝධයෙන් ජාති නිරෝධය වේදූ යි මෙවන් සිතක් උපන.

මහණෙනි, එකල්හි විපස්සි බෝසතාණන් වහන්සේට භවය ( ....) නැති කල ජාතිය නොවේ. භව නිරෝධයෙන් ජාති නිරෝධය වේ, යයි යොනිසො මනසිකාරයෙන් ප්‍රඥාභිසමය විය. කුමක් නැති කල භවය නොවේද, කුමක නිරෝධයෙන් භව නිරෝධය වේද, යි මෙම සිත විය. උපාදානය නැති කල භවය නොවේ. උපාදන නිරෝධයෙන් භව නිරෝධය වේ, යැයි යොනිසො මනසිකාරයෙන් ප්‍රඥාභිසමය විය. ඉක්බිති කුමක් නැති කල උපාදානය නොවේදි, කුමක නිරෝධයෙන් උපාදානය නිරෝධය වේදූයි මෙම සිත විය. මහණෙනි, එකල විපස්සි බෝසතාණන් වහන්සේට තෘෂ්ණාව නැති කල්හි උපාදානය නොවේ, තෘෂ්ණා නිරෝධයෙන් උපාදානය නිරෝධය වේ යැයි යොනිසො මනසිකාරයෙන් ප්‍රඥාභිසමය විය. කුමක් නැති කල තෘෂණාව නොවේද, කුමක නිරෝධයෙන් තෘෂ්ණා නිරෝධය වේදූයි මෙම සිත විය. වේදනාව නැති කලතෘෂ්ණාව නොවේ.

වේදනා නිරෝධයෙහි යැයි යොනිසො මනසිකාරයෙන් ප්‍රඥාභිසමය විය.

ඉක්බිති බෝසතාණන් වහන්සේට කුමක් නැති කල වේදනාව නොවේද, කුමක් නිරෝධයෙන් වේදනා නිරෝධ වේදැයි මෙ සිත විය. සපශී නැතිකල වේදනාව නොවේ, සපශී නිරෝධයෙන් වේදනා නිරෝධය වේ යැයි යොනිසො මනසිකාරයෙන් ප්‍රඥාභිසමය විය. කුමක් නැති කල සප්ශීය නොවේද, කිමෙක නිරෝධයෙන් සපශී නිරෝධය වේදැයි මෙවන් සිතක් විය. ෂඩායතනය නැතිකල ස්පශී නොවේ. ෂඩායතන නිරෝධයෙන් ස්පශී නිරෝධය වේ යැයි ප්‍රඥභිසමය විය. මහණෙනි, ඉත්බිත්තෙන් බෝසතාණන් වහන්සේට කුමක් නැති කල ෂඩායතනය නොවේද, කිමෙක නිරෝධයෙන් ෂඩායතනය නිරෝධය වේදැයි මෙම සිත විය. නාම රූප නැති කල ෂඩායතය නොවේ. නාමරූප නිරෝධයෙන් ෂඩායතන නිරෝධය වේ යැයි යොනිසො මනසිකාරයෙන් ප්‍රඥාභිසමය විය. මහණෙනි, ඉක්බිත්තෙන් විපස්සි බෝසතාණන් වහන්සේට කුමක් නැති කල නාමරූප නොවේද? කිමෙක නිරෝධයෙන් නාමරූප නිරෝධය වේදැයි මෙම සිත පහළ විය.

විඥානය නැති කල නාමරූපය නොවේ. විඥානය නිරෝධයෙන් නාමරූප නිරෝධය වේ යැයි ප්‍රඥාභිසමය විය. කුමක් නැති කල විඥානය නොවේද, කිමෙක නිරෝධයෙන් විඥාන නිරෝධය වේදැයි මේ සිත විය. මහණෙනි, එකල විපස්සි බොසතාණන් වහන්සේට නාමරූප නැති කල විඥානය නොවේ, නාමරූප නිරෝධයෙන් විඥාන නිරෝධය වේ යැයි යොනිසො මනසිකාරයෙන් ප්‍රඥාභිසමය විය. මහණෙනි, ඉක්බිත්තෙන් බෝසතාණන් වහන්සේ හට නාමරූප නිරෝධයෙන් විඥාන නිරෝධය වේ. විඥාන නිරෝධයෙන් නාමරූප නිරෝධය වේ. නාමරූප නිරෝධයෙන් ෂඩායතන නිරෝධය වේ. ෂඩායතන නිරෝධයෙන් ස්පශී නිරෝධය වේ. ස්පශී නිරෝධයෙන් වේදනා නිරෝධය වේ. වේදනා නිරෝධයෙන් තෘෂ්ණා නිරෝධය වේ. තෘෂ්ණා නිරෝධයෙන් උපදාන නිරෝධය වේ. උපාදන නිරෝධයෙන් භව නිරෝධය වේ. භව නිරෝධයෙන් ජාති නිරෝධය වේ. ජාති නිරෝධයෙන් ජරා, මරණ, සෝක,

පරිදේව, දුක්, දොම්නස්, උපායාස ( .........) යන මොහු නිරුද්ධ වෙති. මෙසේ සියළු දුක්රැස් නිරෝධය වේ යැයි මෙම සිත විය.

මහණෙනි, එවිට විපස්සි බෝසතාණන් වහන්සේට නිරෝධය, නිරෝධ යැයි,ම පෙර නොඇසූ දහම් ඇස උපන නුවණ උපන, ප්‍රඥාව, උපන, විද්‍යාව උපන, ආලෝකය උපන. මහණෙනි, විපස්සි බෝසතාණන් වහන්සේ රූපය මෙසේය, රූපසමුදය මෙසේය, රූප නිරෝධය මෙසේය, වේදනාව මෙසේය, වේදනා සමුදය මෙසේය. වේදනා නිරෝධය මෙසේය. සංඥාව මෙසේය, සංඥා සමුදය මෙසේය. සංඥා නිරෝධය මෙසේය. සංස්කාරයෝ මෙසේය, සංස්කාර සමුදය මෙසේය. සංස්කාර නිරෝධය මෙසේය. විඥානය මෙසේය, විඥාන සමුදය මෙසේය, විඥාන නිරෝධය මෙසේ යැයි උපාදන ස්කන්ධ පහෙහි ඉපදීමත් නැසීමත් අනුව බලන සුළුව විසීය. මේ අනුව මෙතුමාගේ සිත නොබෝ කලකින්ම සියළු ආශ්‍රවයන් කෙරෙන් මිදුනේය. උතුම් වූ ලොව්තුරු බුඬ රාජ්‍යයට පැමිණ වදාළ සේක.

මහණෙනි, ඉන්පසු භාග්‍යවත් අභිත් විපස්සි සම්මා සම්බුදු රජාණන් වහන්සේට මෙවන් සිතක් විය. ලෝක සත්ව සන්හතියට මම ධර්ම දේශනා කරන්නේ නම් ඉතා යහපත එනමුත් මෙම ධර්මය ගැඹුරුය. දුකසේ දැකිය යුතුය. දුකසේ අවබෝධ කරගත යුතුය. ශාන්තය, ප්‍රණීතය, තර්කයෙන් බැසගත නොහැක්කේය. සියුම් නුවණින් දැනගත යුතුය. මේ සත්ව සංහතිය ආලය සංඛ්‍යාත කාම ගැන තෘෂ්ණාවෙන් සතුටු වන්නේය. කාමයන්ගෙන් ඇලී ගැලී වසන්නේය. ආලයන්ගෙන් සතුටුවන, ආලයන්හි ඇලුන, ආලයන්හි දැඩිසේ මුදිත වූ සත්මුළුව විසින් පටිච්ඡසමුප්පාදයත්ම (....) වූ යමෙක් ඇද්ද ඒ මේ කාරණය දක්නට දුෂ්කරය. තෘෂ්ණාක්ෂය, විරාගය, නිරෝධය, නිර්වාණය, යි කියන ලද යම් මේ දහමක් වේද, මේ කාරණයද දැක්ම දුෂ්කරය. එය එසේනම් මම ධර්මය දේශනා කරන්නේ නම්, අන්‍යයන් මගේ එම දහම අවබෝධ නොගත්තාහු නම්, එය මා හට වෙහෙසක් පමණක් වන්නේය. යන සිතිවිල්ල ඇතිවිය.

මහණෙනි, එපමණක් නොව විපස්සි බුදුරජාණන් වහන්සේට පෙර නොඇසූ විරූ සිතත්, ආශ්චර්‍ය්‍ය දනවන මෙම ගාථාවද අවබෝධ වූ සේක. ''මා විසින් දුකසේ අවබෝධ කරණ ලද ධර්මය ප්‍රකාශ කරන්නට මෙය සුදුසු අවස්ථාවක් නොවේ'' (මේ අවස්ථාවේ දේශනා කිරීමෙන් වන යහපතක් නැත) මා විසින් දේශනා කරන ධර්මය රාග, ද්වේශාදී කෙළෙසුන්ගෙන් බරිත වූවන්ට පහසුවෙන් අවබෝධ කරගැනීමට නොහැකිය. නිත්‍ය සංඥාදියට විරුද්ධ අනිත්‍ය සංඥාදි වශයෙන් පැවති නිපුණ වූ ගැඹුරු දුකසේ දැකිය යුතුවූ, සූක්‍ෂමවූ මෙම ධර්මය රාගයෙන් රත්වූ අවිද්‍යාවෙන් පිරුණු සත්වයෝ නොදනී. මෙසේ සම්බුදු රජාණන් වහන්සේගේ සිත මන්දොත්සාහි බවට පැමිණුනේය. එවිට බුදුරජාණන් වහන්සේගේ සිත සිය සිතින් අවබෝධ කරගත් එක් බ්‍රහ්මරාජයෙක්, සර්‍වඥයන් වහන්සේගේ සිත මන්දොත්සාහි බවට පත්වේද, ධර්මය දේශනා කිරීමට නොසිතත්ද, එම ලෝකය විනාශ වන්නේය. එම ලෝකය ඒකාන්තයෙන්ම වැනසේමය, යි මේ සිත විය.

මහණෙනි, ක්‍ෂණයකින් එම බ්‍රහ්මරාජයා විපස්සි බුදුරජාණන් වහන්සේ ඉදිරියෙහි පෙනී සිටියේය. ඉක්බිති බ්‍රහ්මරාජයා බුදුරජාණන් වහන්සේට වැඳ නමස්කාර කර ''තථාගතයන් වහන්ස, දහම් දෙසත්වා, සුගතයන් වහන්ස, දහම් දෙසන සේක්වා. ස්වල්ප වූ රාග, කෙළෙස් ඇති සත්වයෝ බොහෝ සිටිති. ඔවුන්ට ධර්මය ඇසුමට නොලැබුනොත් පිරිහෙති. ධර්මය අවබෝධ කරගත හැකි සත්වයෝ බොහෝ වෙති. එමනිසා භාග්‍යවතුන් වහන්ස, සියළු සත්වයන්ට හිත සුව පිණිස ලෝකනුකම්පාවෙන් ධර්මය දේශනා කරන සේක්වා යි ''අයැද සිටියේය.

මහණෙනි, එකල්හි සර්‍වඥයන් වහන්සේ මහා බ්‍රහ්මයා අමතා ''බ්‍රහ්මය, මටද මම දහම් දෙසන්නෙහි නම් ඉතා යහපතැයි සිතුනි, එනමුත් මා අවබෝධ කල ධර්මය ඉතා ගැඹුරුය, දුකසේ දැකිය යුතුය, දුකසේ අවබෝධ කලයුතුය, ශාන්තය, ප්‍රණීතය, තර්කයෙන් තේරුම්ගත නොහැකිය, සියුම්ය, පණ්ඩිතයන් විසින් දත යුතුය. මේ සත්ව ප්‍රජාව පස්කම් සැපතම ප්‍රාර්ථනා කරන්නේය. ධර්මය දුකසේ දැකිය යුතුය. දුකසේ අවබෝධ කල

යුතුය, සියළු සංස්කාරයන්ගෙ සංසිඳීම, සියළු උපදින්ගේ දුරලීම, තෘෂ්ණක්ෂය, විරාගය, නිරෝධය, නිර්වාණය යන මේ කරුණුද දුකසේ දැකිය යුතුය. මමත් ධර්මය දේශනා කරනු ලබන්නේ නම් එම ධර්මය අන්අය අවබෝධ කරගන්නේ නැත්නම් මට එය පීඩාවකි. වෙහෙසීමක් පමණි, යි සිතුනි. තවද, බ්‍රහ්මය පෙර නොඇසුවිරූ සිතත් ආශ්චර්‍ය්‍යවන මේ ගාථාවෝ මට වැටහුනහ.

මා විසින් ඉතා දුකසේ අවබෝධ කරන ලද ධර්මය දේශනා කරන්නට නුසුදුසුය. රාග දෝෂාදි කෙළෙස්වලින් වැඩුනවුන් විසින් මෙම ධර්මය පහසුවෙන් අවබෝධ කරගත නොහැකිය. නිවණ කරා යන නිපුණ වූ ගැඹුරු වූ දුකසේ දැකිය යුතු වූ සියුම් වූ ධර්මය රාගයෙන් රත්වූ මෝහයෙන් මුලා වූ සත්වයින්ට නොපෙනේ. මෙසේ සළකන මගේ සිත මන්දොත්සාහි බවට පත්විය. ධර්මය දේශනා කිරීමට සිත යොමු නොවී යැයි විපස්සි බුදුරජාණන් වහන්සේ බ්‍රහ්මරාජයාට වදාළ සේක. මහණෙනි, දෙවෙනි, තෙවනි, වරූ එම බ්‍රහ්රාජයාණන් ලෝකය විනාශ නොවී ආරක්ෂාකර ගැනීම පිණිසත්, දහම්මඟ යන සත්වයන්ට ධර්මය ඇසීමට නොලැබුණොත් එම සත්වයින්ද විනාශයට පත්වන බවත් පවසා සිටියේය. ධර්මය දේශනා කරන මෙන් නැවතත් අයැද සිටියේ.

මහණෙනි, ඉන්පසු විපස්සි බුදුරජාණන් වහන්සේ බ්‍රහ්ම ආරාධනාව ලැබ සත්වයන් කෙරෙහි කරුණාවද නිසා බුදු ඇසින් ලොව බැලූ සේක. එසේ ලොව බැලීමේදී ස්වල්ප කෙළෙස් රජස් ඇති අයද, බොහෝ කෙළෙස් රජස් ඇති අයද, තියුණු ඉඳුරන් ඇති අයද, මොලොක් වූ ඉඳුරන් ඇති අයද, මනා අයුරු ඇති අයද, නොමනා අයුරු ඇති අයද, පහසුවෙන් ධර්මය අවබෝධ කරදිය හැකි අයද, බොහෝ අපහසුවෙන් ධර්මය අවබෝධ කරදිය හැකි අයද, පරලොව භිය දන්නා පරලොව භිය ඇති අයද, පරලොව වරදක් භයක් ලෙස පිළිනොගන්නා වූ සත්වයින්ද, මෙසේ නානාවිධි සත්වයන් වසන බව බුදු නැණින් දැක දැන ගත් සේක. යම්සේ ජලාශයක පීපී තිබෙන්නාවූ ඕලූ, නෙළුම්, මානෙල් මල්වන් එම ජලාශයෙහි හැදී, වැඩී, දිය යටම විනාශවන මල්ද, පොහොට්ටු

අවස්ථාවේම විනාශවන මල්ද, දියෙන් මතුපිටට අවුත් එම ජලය හා ගැටීමක්, තැවරීමක් නැතිව තිබෙන්නාවූ පුෂ්පයන් සේ විවිධ සිත් සතන් ඇති ධර්ම, අධර්ම මාර්ගයන්හී යන සත්වයින්ද, පඤ්චකාම සම්පත්තියෙහිම ඇලී, ගැලී වසන සත්වයින්ද විපස්සි සර්වඥයන් වහන්සේට දර්ශනය වූ සේක. ඒබැව් සිතින් දැනගත් මහා බ්‍රහ්මරාජයාණන් අපමණ සතුටට පත්ව මෙසේ පැවසීය.

කඳුමුදුනක සිටින කෙනෙක් අවට වටේම සිටින අය දක්නා ආකාරයට තථාගතයන් වහන්සේ, සියළු සත්වයින් දැක මෙම සත්ව සංහතියට මා පිහිටවිය. යුතුයි යන මහා කරුණා බරින් එම සත්වයින් සසර දුකින් මුදවා මමද එයින් මිදෙමි, යී මහත් කරුණාවෙන් දහම් දෙසීමට සිතීම අඳුරට ආලෝකයක් වැනිය. නිදුකාණන් වහන්සේ නැගී සිටිනු මැන, ලොව සැරිසරනු මැන, භාග්‍යවතුන් වහන්ස, මෙය ධර්මය දේශනා කිරීමට අවස්ථාවයි තුන්වාරයක් ආරාධනා කිරීමෙන් පසු බ්‍රහ්මරාජයා අමතා මෙසේ වදාළ සේක.

බ්‍රහ්ම රාජය, කන් ඇති යමෙක් වෙත්නම් ඔහු ශ්‍රද්ධාව යොමු කොට අසත්වා. ඔවුන්ට නිවනේ දොර විවෘත කරමි. නොදන්නවුන්ට දහම් දෙසීම වෙහෙසට පත්වීමක් පමණි. ඉන්පසු එම බ්‍රහ්මරාජයාණෝ විපස්සි බුදුරජාණන් වහන්සේ තමාගේ ආරාධනාව පිළිගත් බැව් දැන තුන්වරක් පැදකුණු කොට ආදර ගෞරවයෙන් වැඳ නමස්කාර කර අතුරුදහන් විය.

මහණෙනි, එකල්හි විපස්සි සර්වඥයන් වහන්සේට මෙවන් සිතක් පහළ වූ සේක. මම කාටනම් පළමු කොට දහම් දෙසැම්දැයි කවුරු මේ ධර්මය වහා අවබෝධ කරගනිත්ද? යි සිතූ සැණින් "**ඛණ්ඩ**" නම් රාජපුත්‍රද " **තිස්ස**" නම් පෙරෙවි පුත්ද යන පණ්ඩිත ව්‍යක්තවූ නුවණැති දීර්ඝ කාලයක් අල්ප රජස්ක ස්වභාවය ඇති මේ දෙදෙනා බන්ධුමතී රාජධානියෙහි සිටියි. මෙම දෙදෙනාට පළමුකොට දහම් දෙසීනම් මැනවයි ඔවුන් ධර්මය අවබෝධ කරගන්නේ යැයි මේ සිත ඇති වූ සේක.

මහණෙනි, ඉක්බිති බුදුරජාණන් වහන්සේ වක්කල අත දිග හරින සැණින් බෝධිමූලයෙන් අතුරුදහන්ව බංධුමතී රාජධානියෙහි ''ක්ෂෙම'' නම් මුව වනයෙහි පහළ වූ සේක. ඉක්බිති බුදුරජාණන් වහන්සේ උයන් පාලකතුමා කැඳවා බංධුමතී නුවරට ගොස් ඛණ්ඩය නම් රාජපුත්‍රටද, තිස්ස නම් පෙරෙවි පුතුටද බුදුරජාණන් වහන්සේ ඔබ දෙපල බලාපොරොත්තුවෙන් අපගේ උයණේ වැඩි සිටිති යි කීවේය. එසැණින් ඒ දෙදෙනා වාහනයෙන් යා හැකි දුර ගොස් එතැන් සිට බුදුරජාණන් වහන්සේ වැඩසිටි ස්ථානයට පා ගමනින්ම ගියේය.

ඉක්බිති ඒ දෙදෙනා භාග්‍යවතුන් වහන්සේට වැඳ නමස්කාර කොට පසව හිඳගත් පසු දාන කථාද, ශීල කථාද, සවර්ගී කථාද, කාමයන්ගේ ආදීනවද, ලාමක බවද, කිළිටිදොස් බවද, කාමයන්ගෙන් වෙන්වීමේ ආනිසංසද යන පිළිවෙල කථාව දක්වා වදාළ සේක. ඉන්පසු සියළුම බුදුරජාණන් වහන්සේලා ස්වභුඥාණයෙන් අවබෝධ කරගත්තා වූ දුක්ඛ, සමුදය, නිරෝධය, මාර්ග යන ධර්මද වදාළ සේක. එම දේශනාවන් අවසන් වෙත්ම පුත්‍ර දෙපලට සියළුම කෙළෙස් ධර්මයන් ක්ෂයවී දහම් ඇස පහළ වුන සේක. දෙදෙනා වහන්සේම බුදුරජාණන් වහන්සේටද වැඳ නමස්කාර කරමින් භාග්‍යවතුන් වහන්සේගේ පැවිද්ද ලැබේවා, යි අයැද සිටි සේක. එවිට විපස්සි බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ පළමු පැවිද්ද සමඟ උපසම්පදාව ලත් සේක. ඉන්නොබෝ දිනකින්ම උතුම් වූ රහත් භාවයටද පත්වූ සේක.

මහණෙනි, බන්ධුමතී රාජධානියෙහි ප්‍රාණින් අසූහාර දහසක් වූ ජන සංඛ්‍යාවක් ක්ෂෙම නම් මෘග වනයෙහි වැඩ වසති. ''ඛණ්ඩ'' රාජපුත්‍රද, ''තිස්ස'' පෙරෙවි පුත්ද සියළුම ගිහි සබඳතා වලින් මිදී පඤ්චකාම සැපයෙන් වෙන්වී කෙස් රැවුල් බා කසාවත් පොරොවා භාග්‍යවතුන් වහන්සේ මෙතනින් පැවදි උපසම්පදාව ලබාගත් බවත් එම දෙදෙනා එසේ තත්වයට පත්වන්නට විශේෂ හේතුවක් තිබිය යුතුයි. බුදුසසුන එසේ මෙසේ දෙයක් නොවිය යුතුයි. හේතු කාරණා එසේ නම් අප පැවදි වනු පුදුමයක් දැයි සිත් පහළ වූහ.

මහණෙනි, එම අසූහාර දහසක් සේනාව විපස්සි බුදුරජාණන් වහන්සේ වෙත ගොස් වැඳ නමස්කාර කර පසෙකින් හිඳගත් පසු බුදුරාජාණන් වහන්සේ විසින් දාන කථා, ශීල කථා, ස්වර්ග කථා සහ කාමයන්ගේ ආදීනවද, ලාමක බවද, කෙලිසීමද, කාමයන්ගෙන් වෙන්වීමේ ආනිසංසද යන පිළිවෙල කථා වදාළ සේක. සර්‍වඥයන් වහන්සේ යම් විටෙක නිරෝග සිතැති, මොලොක් සිතැති, නීවරණ රහිත සිතැති ඔදවැඩි සිතැති පහන් සිතැති ඔවුන් දන්නාහුද, එකල්හි දුක්ඛ සමුදය, නිරෝධ මාර්ග යන තමන් වහන්සේලා විසින්ම අවබෝධ කල යම් ධර්මදේශනාවක් වෙත්ද එය වදාළ සේක. ඉන්පසු එම අසූහාර දහසටම සිටි ස්ථානයෙහිම උපදනා  සුලු යමෙක් ඇත්ද ඒ සියල්ල නැසෙන සුළුය. යි කෙළෙස් රජස් පහවු කෙළෙස්මළ පහවූ දහම් ඇස පහළ වූහ.

දුටු චතුරාර්‍යය සත්‍ය ධර්මය ඇති, පැමිණි චතුරාර්‍යය සත්‍ය ධර්ම ඇති, දැනගත් චතුරාර්‍යය සත්‍ය ධර්ම ඇති, නුවණින් බැසගත් චතුරාර්‍යය සත්‍ය ධර්ම ඇති, තරණය කල විචිකිච්ඡා ඇති, සැක නැති, විශාරද බවට පැමිණි ශාසනයෙහි පරප්‍රත්‍යය රහිත ඔවුහු සර්‍වඥයන් වහන්සේට මෙසේ පැවසූහ. ''භාග්‍යවත් තථාගතයන් වහන්ස, දේශනාව ඉතා යහපත්ය, වැරදිමඟ ගමන්කරන්නෙකුට නිසිමඟ පෙන්වා දෙන්නේද, ඇස් ඇතියන් රූපදකිති. අඳුරට ආලෝකයක් වැන්න, එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් කරුණු කාරණාවලින් ධර්මය වදාළ සේක. ''ස්වමීනි, අද මෙවෙලේ පටන් බුදුරජාණන් වහන්සේ සරණයාද, දහම් සරණයාද, සඟ සරණ යාද, අපගේ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලබමෝවා, උපසම්පදා ලබමෝවායි කීහ. එම ඉල්ලීම අනුව විපස්සි බුදුරජාණන් වහන්සේ සමීපයෙහි අසූහාර දහසටම පැවිදි භාවය සහ උපසම්පදාවද ලදහ. ඉන්පසු එම පිරිසට නොයෙක් ආකාරයෙන් අවවාද අනුශාසනා කළසේක. ඔවුන්ගේ සිත් දියුණු කළ සේක. නිවණෙහි ආනිසංසද වදාළ සේක. ඔවුන්ගේ සිත් සතුටු කිරීමත් සමගම නොබෝ දිනකින්ම සියළුම උපාදාන රහිතව රහත් භාවයට පත්වූ සේක.

මහණෙනි, ඉන්පසු පළමුව පැවිදි භාවයට පත් පැවිද්දන් අසූහාර දහසටද මෙම පුවත දැනගැනීමට ලැබී සම්මා සම්බුදුරජාණන් වහන්සේ යම් ස්ථානයකද එම ස්ථානයට පැමිණ වැඳ එකත්පස්ව සිටියහ. එවිට ඔවුන්ටද පෙර පැවිදි භාවයට පත් පැවිද්දන්ට දුන් ආකාරයටම දේශනා කළ සේක. ඉන්පසු එම භික්ෂූන් අසූහාර දහසම බොහෝ සතුටට පත්ව මනා ලෙස චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මය අවබෝධ කරගෙන හුන් අසුනෙහිම සියළු කෙළෙස් වලින් මිදුනාහ. පෙරසේම ඔවුන්ද පැවිද්ද, උපසම්පදාව ලබා නොබෝ දිනකින්ම සසර ගමන නිමකරන උතුම් රහත් භාවයට පත්වූ සේක. මහණෙනි, එකල්හි බංධුමතී රාජධානියෙහි රහතන් වහන්සේලා එක්ලක්ෂ හැටඅටදහසක් වැඩ වසති.

මහණෙනි, එකල්හි හුදකලා චිත්ත වේවේකයෙන් හුන් විපස්සි බුදුරජාණන් වහන්සේට මෙබඳු සිතක් පහළ විය. දැන් මේ බංධුමතී රාජධානියෙහි රහත් භික්ෂූන් එක්ලක්ෂ හැටඅටදහසක් වූ මහත් භික්ෂූ පිරිසක් වෙසෙති බොහෝ දෙනාට හිත සුව පිණිස ලොවට අනුකම්පාවෙන්, දෙව් මිනිසුන්ට හිත වැඩ පිණිස සැරිසරවු දෙදෙනෙක් එක මඟ නොයවු, අර්ථ සහිත දහම් දේශනා කරවු, අල්ප කෙළෙස් රජස් ඇති සත්වයෝ වෙති. (පාප ක්‍රියාවන්ට භිය) ධර්මය ඇසීමට නොලැබුණොත් ඔවුහු දුකට පත් වෙති. ධර්මය අවබෝධ කරගැනීමට පිණ ඇත්තෝ බොහෝ වෙති. අවුරුදු හයෙන් හයට පාමොක් දෙසුමට (පොහොය කිරීමට) බංධුමතී රාජධානියට එක්රැස් වෙන්නැයි අවවාද දුනහොත් මැනව'යි යන සිතිවිල්ල පහළ වූ සේක.

මහණෙනි, විපස්සී සර්වඥයන් වහන්සේගේ එම සිතිවිල්ල සිය සිතින් දැනගත් බ්‍රහ්ම රාජයෙක් ක්ෂණයකින් භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි පෙනී සිටිමින් උතුරු සළුව ඒකාංශකර දකුණු දණ මඬල බිම තබා දොහොත් මුදුනේ තබා වැඳ නමස්කාර කර තථාගතයන් වහන්ස, එය එසේම වේවා'යි කියා ලෝක සත්වයාට, දෙවියන්ට බොහෝසේ හිත වැඩ වන්නේය, ලෝකය විනාශයෙන් මිදෙන්නේය, බොහෝ සත්වයෝ ධර්මය අවබෝධ කරගන්නේය, ධර්මයෙන් ප්‍රයෝජන ගන්නේය, සතර අපාගත

වන සත්වයින් අඩු වන්නේය, සදිව්‍යලෝක, බ්‍රහ්ම ලෝක සත්වයන්ගෙන් පිරෙන්නේය' යි පවසා වැඳ නමස්කාර කර එහිම අතුරුදහන් විය.

මහණෙනි, ඉන්පසු විපස්සී බුදුරජාණන් වහන්සේගේ සිතිවිල්ල අනුවම එක්ළක්‍ෂ හැටඅටදහසම භික්‍ෂූන් කැඳවා නැවත අවවාද අනුශාසනා කර සකල සත්වයාගේ හිත සුව පිණිස දුකින් මුදවා ගැනීම පිණිස ගම්, දනවු සැරිසරවු, මාගේ ධර්මය දේශනා කරවු, පිළිපදිවු, අවුරුදු හයකට වරක් බංධුමතී රාජධානියට රැස්වව්, යයි වදාළ සේක.

මහණෙනි, ඉන්පසු භික්‍ෂුහු, එක් දවසකින්ම ජනපද චාරිකාවේ යෙදුනහ. දඹදිව අසූහාර දහසක් ආවාසයො (පන්සල්) තිබුනි. එක් අවුරුද්දක් ගෙවී ගිය පසු නිදුකාණනි, අවුරුද්දක් ගෙවීමෙන් පසු පොහොය කිරීමට වැඩිය යුතුයැයි දෙවියෝ ශබ්දානු ශ්‍රාවණය කළහ. මෙයාකාරයට අවුරුද්දෙන් අවුරුද්දට දෙවියන් විසින් සියළුම භික්‍ෂූන් වහන්සේලාට ඇසෙන පරිද්දෙන් දැනුම් දෙමින් හයවන අවුරුද්ද අවසානයේ නිදුකාණනි, අවුරුදු හය ගෙවී අවසානයි. පෙහොය කිරීමට බංධුමති රාජධානියට එක් රැස්වීමට කාලය වේ, යැයි ශබ්ද නැගුහ.

මහණෙනි, එකල්හී එම භික්‍ෂූන් වහන්සේලා ඇතැම් කෙනෙක් තමන්ගේ සෘද්ධි බලයෙන්ද, තවත් කෙනෙක් දෙවියන්ගේ සෘද්ධි බලයෙන්ද බංධුමති රාජධානියට පාමොක් උදෙසනු සඳහා එක දවසින්ම වැඩි සේක. මහණෙනි, එහි විපස්සි සම්මා සම්බුදුරජාණන් වහන්සේ එක්රැස්වූ භික්‍ෂු සමාගමයෙහි මෙසේ පාමොක් දේශනා කළ සේක. පරෝපකාරයත්, පරෝපවාදයත්, ඉවසීම වූ අධිවාසන ක්‍ෂාන්තිය උතුම් තපසකයැයි ද, නිවණ සියල්ලෝ උතුමට දහමැයි ද බුදුරජාණන් වහන්සේ වදාරති.

අනුන් පෙලන්නේ පැවිද්දන් නොවේ. අන්‍යයන් වෙහෙසන්නේ පැවිද්දන් නොවේමය. සියළුම පාප ක්‍රියාවන්ගෙන් වළකිනු. කුසල් උපදවනු හා වඩනුද සිය සිත පිරිසිදු කරනුද යන මේ බුදුරජාණන්

වහන්සේලාගේ ශාසනය යි, අන්‍යයන්ට අපහාස කිරීමද, අන්‍යයන් පීඩාවට පත් නොකිරීමද, පාමොක්හි සංවරයද, දානයෙහි ප්‍රමාණයද, දූනගැනීමද, ග්‍රාමයෙන් වෙන්ව විසීමද මෙහි කැමැත්තද, අධි චිත්තයෙහි (රූපාරූප අට සමවත්හි) යෙදෙනුද යන මේ බුදුරජාණන් වහන්සේලාගේ ශාසන යයි.

මහණෙනි, මම එක් සමයෙන්හි උක්කට්ඨා පුරය සමීපයෙහි වූ ශුභහ වනයෙහි මහා රුකක් මුල වැඩ සිටියෙමි. මහණෙනි, එකල, ව චිත්තවිවේකයෙන් යුක්ත වූ මට මේ දීර්ඝ කාලය තුල ශුද්ධාවාසයක් හැර මා වාසය නොකරපු එකද සත්ව වාසයක් නොදකිමි. ශුද්ධාවාසි දෙවියෝ යම් තැනෙක වෙත්ද, එතනට යාමට ඇත්තම් යහපැතැයි යන සිතිවිල්ලක් උපන. මහණෙනි, එවිට මම සිටි ස්ථානයෙන් අතුරුදහන්ව පඤ්ච සුද්ධාවාසයන්ගෙන් පළමුවන ශුද්ධාවසය වන **"අවිහ"** බඹලොව දෙවියන් අතර පහළ වුනි.

මහණෙනි, එම බඹලොවෙහි දෙවියන් දහස් ගණනින්, ලක්ෂ ගණනින් මා වෙත පැමිණ වැඳ එකත්පසෙක සිට මට මෙසේ කීහ. "නිදුකාණන් වහන්ස, යම් කලෙක භාග්‍යවත් අභීත් විපස්සි සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලෝ පහළ වීද, ඒ මෙයින් අනුඑක්වන කල්පයෙහිය. නිදුකාණන් වහන්ස, අපි ඒ බුදුරජාණන් වහන්සේ කෙරෙහි බඹසර වැස කාමයන්හි කාමච්ඡන්දය නැති කොට මෙහි උපන්නමොය" යි සැළ කළහ. මහණෙනි, එම දෙවනිකායෙහිම, දහස් ගණන් දෙවියෝ, ලක්ෂ ගණන් දෙවියෝ මා වෙත පැමිණයහ. එසේ පැමිණ මට මෙසේ කීහ ඃ- "නිදුකාණන් වහන්ස, දැන් මේ භද්‍ර කල්පයෙහිම භගවත්, අභීත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොව පහළ වූවාහු වෙති. භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේ කෙරෙහි බඹසර වැස කාමයන්හි කාමචඡන්දය දුරුකොට මෙහි උපන්හ" යි කීහ.

මහණෙනි, ඉක්බිති මම අවිහ දෙවියන් සමඟ දෙවන සුද්ධාවාසය වන **"අතප්ප"** දෙවියන් කරා ගියෙමි. මහණෙනි, ඉන්පසු මම අවිහ දෙවියන්ද, අතප්ප දෙවියන් හා තුන්වන සුද්ධාවාසය වන **"සුදස්ස"**

දෙවියන් කරා ගියෙමි. මහණෙනි, ඉන්පසුව මම අවිහ දෙවියන්ද, අතප්ප දෙවියන්ද, සුධස්ස දෙවියන්ද සමඟින් හතරවන සුද්ධාවාසය වන **"සුදස්සි"** දෙවියන්ද සමඟින් පස්වන සහ අවසාන සුද්ධාවාසය වන **අකනිට්ඨක** බඹලොව දෙවියන් වෙත ගියෙමි.

මහණෙනි, එම දේව නිකායෙහි දහස් ගණන්, ලක්ෂ ගණන් දෙවියන් මා වෙත පැමිණ එකත්පස්ව සිට මෙසේ කීහ. තිදුකාණන් වහන්ස, මෙයට මහා කල්ප තිස්එකකට පෙර භාග්‍යවත් අභීත් **"සිඛී"** සම්මා සම්බුදු රජාණන්වහන්සේ ලොව පහළ වුහූද, තිදුකාණන් වහන්ස, අපි ඒ සිඛී සම්මා සම්බුදු රජාණන්වහන්සේ කෙරෙහි බඹසරවැස, මෙහි උපනුම්හ. තිදුකාණන් වහන්ස, යම් සමයෙක භාග්‍යවත් අභීත් **"වෙස්සභූ"** සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොව පහළ වීද ඒ මෙයින් යට ඒ තිස් එක් වන කල්පයෙහි දෙවන අතුරු කල්පයෙහිමය. අප ඒ වෙස්සභූ බුදුරජාණන් වහන්සේ කෙරෙහි බඹසර වැස මෙහි උපනුම්හ, යි කීහ.

තිදුකාණන් වහන්ස, මෙම මහා භද්‍ර කල්පයෙහිම භාග්‍යවත් අභීත් **"කකුසඳ"** සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. අපි ඒ සම්මා සම්බුදු රජාණන් වහන්සේ වෙත බඹසර වැස මෙහි උපනුම්හ. තිදුකාණන් වහන්ස, මෙම කපෙහි දෙවනි අතුරුකප භාග්‍යවත් අභීත් **"කෝණාගමන"** සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. තිදුකාණන් වහන්ස, අපි ඒ භාග්‍යවතුන් වහන්සේ වෙත බඹසර වැස මෙහි උපනුම්හ. තිදුකාණන් වහන්ස, මෙම කල්පයෙහිම තුන්වන අතුරුකප භාග්‍යවත් අභීත් **"කාශ්‍යප"** සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලොව පහළ වූ සේක. අපි ඒ බුදුරජාණන් වහන්සේ වෙත බඹසර වැස කාමච්ඡන්දය දුරලා මෙහි උපනුම්හ' යි කීහ. (දහස් ගණන්, ලක්ෂ ගණන් දෙවියන් අතරින් ඒ ඒ බුදුරජාණන් වහන්සේලාගේ ශාසන පැවති කාල වකවානු තුලදී දාන, ශීල, භාවනා පමණක් නොව පඤ්චකාම සම්පත් පිළිකුල්කල බ්‍රහ්මචාරී ජීවිත ගතකල උත්තමයාණන් පමණක් මෙකී පඤ්ච සුද්ධාවාස බ්‍රහ්මයන් වූ බවත් ඉහත සඳහන් දේ කියවන විට එකම පිරිසක් එසේ කියවපු බව හැගීයතත් එකී එකී පිරිස් විසින් එකී එකී බුදුසසුන් තුල ලබාගත් හේතු

සම්පත් කියවුනේ)

මහණෙනි, ඒ දෙව්නිකාහිම නොයෙක් දහස් ගණන් දෙවියෝ, නොයෙක් ලක්‍ෂ ගණන් දෙවියෝ මා වෙත එළඹීයහ. මා වැඳ එකත්පස්ව සිටියහ. එසේ සිටි දෙවියෝ මට නිදුකාණන් වහන්ස, මේ භද්‍ර කල්පයෙහිම සම්මා සම්බුදු වූ භාග්‍යවතුන් වහන්සේ ලෝ පහළ වූ සේක.

''නිදුකාණන් වහන්ස, මුබ කෙරෙහි බඹසර වැස කාමයන්හි කාම රාගය නැතිකොට මෙහි උපනුම්හ'' යි මෙය කීහ.

මහණෙනි, මෙසේ යම් ධර්ම ධාතුවක් මොනවට පිළිවිදි බැවින් තථාගත තෙමේ ඒ බුදුරජාණන් වහන්සේලා මෙනම් ජාතියෙහි උපන්නයිද, මෙනම් ඇත්තෝ, මෙනම් ගෝත්‍ර ඇත්තෝ, මෙබඳු ධර්ම ඇත්තෝ, මෙබඳු ප්‍රඥා ඇත්තෝ, මෙබඳු විහරණ ඇත්තෝ, මෙබඳු විමුක්ති ඇත්තෝ වූහ'' යි පිරිණිවියාවු, සිඳින ලද ප්‍රපඤ්ච ඇති, සියළු දුක් ඉක්මවූ අතීත බුදුරජාණන් වහන්සේලා ජාති වශයෙනුත් සිහි කෙරේද, නාම වශයෙනුත් සිහි කෙරේද, ගෝත්‍ර වශයෙනුත් සිහි කෙරේද, ආයුෂ ප්‍රමාණ  වශයෙනුත් සිහි කෙරේද, ශ්‍රාවක යුග වශයෙනුත් සිහි කෙරේද,  ශ්‍රාවක සන්නිපාත විසිනුත් සිහි කෙරේද, මහණෙනි, සර්වඥයන් වහන්සේ විසින්ම ඒ ධර්ම ධාතුව මොනවට පිළිවිදුනා ලද්දේය.... ඒ භාග්‍යවතුන් වහන්සේලා මෙබඳු විමුක්ති ඇත්තොවූහ'යිද, තථාගත බුදුරජාණන් වහන්සේ විසන් පිරිණිවී වදාළ අතීත බුදුරජාණන් වහන්සේලා යමෙකින් සිහි කෙරෙත්ද... දෙවියොත් මේ කරුණ අපගේ ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේට දැන්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. ඒ භික්‍ෂූහු සතුටු සිතැත්තාහු අප ගෞතම බුදුරජාණන් වහන්සේගේ දේශනාව පිළිගත්හ.

**පළමුවන මහාපදාන සූත්‍ර දේශනාව නිමියේ යි.**

# පසුවදන

පින්වත් ඔබ මෙම දහම් පොත ශ්‍රද්ධාවෙන්, භක්තියෙන් යුතුව කියවූවානම් නැවත වාරයක් සිත එහෙ මෙහෙ දුවන්න නොදී මෙම දේශනාව තුළම තබා 19 වැනි පිටුවේ සිට 23 වන පිටුව දක්වා කියවන්න. එවිට සසර දුක බිය අවබෝධ කර ගැනීමට මේවා සිහියට ගන්න.

සම්බුද්ධ ශාසනයක් තිබෙන රටක එහි හිමිකරුවන් වී ඉපිද ආලෝකයෙන් අඳුරට ගිය බියගම විලේජ් අධිපතිතුමාගේ පුතා සහ රත්මලානේ ගොළුමඩමේ බිරිඳ, දරුවන් පුළුස්සා මරා දැමූ පුරුෂයා සහ කොටකෙතන මව මැරූ අජාසත්ත පුතාගේ පාපොච්ඡාරණයත් ගැන නොව සසර භයංකාරත්වය ගැන සිතා වහ වහා සසර ගමණ නිමා කිරීමට උත්සහ කරන්න. මේ වන විට මාගේ වයස අවුරුදු 76 ය පසුකර ගෙනයි යන්නේ. කොටකෙතන අජාසත් පුතාගේ ක්‍රියාව සහ පාපොච්ඡාරණය තරම් ඇඟ කිළි පොලා ගිය වෙනත් සිද්ධියක් අසා නැත.

මෙකී පුද්ගලයන් ජීවත්ව සිටිනතාක් පමණයි ඔවුන් සැප විඳින්නේ. ඔවුන්ගේ මරණය වන අවස්ථාවේ ජීවමාන බුදුරජාණන් වහන්සේ නමකගේ සිවුරේ එල්ලී සිටියත් අවීචිමහ නිරයට වැටීම වැළැක්විය නොහැක. එය පපඩමක් උණුතෙල් තාච්චියකට දැමූ සැණින් වන වෙනස මෙන් කාලනියමයක් නොමැති තරම්, ඇසිපිය හෙළන තරම් වේලාවක්ද නොමැතිව ගවු ගණන් උස ශරීර මතුවී දෙදණ දක්වා ගිණි අඟුරු ගොඩේ එරී මහත් වේදනා විඳවන්නේ නිවන් දක්නා ජාති දක්වාම එම කරුම අකුසලය පසුපස එලව එලවා විපාක දෙන්නේය.

මේවාට ඔවුන්ගේ දෙමාපියෝත් වගකිව යුතුයි. මහා කල්ප අසංඛ්‍ය ගණන් ගෙවී ගියත් බුද්ධ කියන වචනමාත්‍රයකුදු අසන්නටවත් නොලැබෙන අපගේ සසර ගමනේදී ලබාගත්තාවූ මේ බුදු සසුන ප්‍රයෝජනයට නොගැනීම බියගම විලේජ්හි පියා එකා යකා වගේ හදාවඩා ගැනීමත්, කොටකෙතන මවක් තම දරුවන් දෙදෙනා සමඟ බිත්තර තම්බා

කන තරමට පහත් තත්වයට පත්වීමෙන් සහ බුදු දහමේ පෙන්වන පළමුවන පාප කර්මය වූ ප්‍රණඝාත අකුසලයේ දිට්ඨධම්ම වේදණීය අකුසලය කළ නිසා ආලෝකයෙන් ආලෝකයට යනවා වෙනුවට ආලෝකයෙන් අඳුරෙන් අඳුරටම වැටුණේය.

මිල මුදල් කොපමණ දුෂ්කරතා තිබුණත් මෙම මාගේ 16 වන දහම් ග්‍රන්ථයත් එසේම පහළොස්වන දහම් ග්‍රන්ථය වන '' කොසොල් මහරජතුමා දුටු සිහින 16'' පොතත් මුද්‍රණය කර ප්‍රසිද්ධ කිරීමට හැකිවීම ගැන මම සතුටු වෙමි.

කලක් නිරා දුක්විඳ විටෙක ගොඩ දුටු
නොයෙක් රෝග හටගෙන ගතවෙයි අරිටු
උදක් නුවණ නැතිවෙයි සිතවෙයි කිළුටු
මෙවක් පටන් වස විස මෙන් සිතව මිසදිටු

(ලෝවැඩ සඟරාව 104 වන කවිය)

තේරුම ඃ-

මිථ්‍ය දෘෂ්ටි අදහස් දරණ නිරයේ දුක්විඳ එයින් මිදී මිනිසත් බවට ආවොත් බොහෝ ලෙඩදුක් ඇතිවී විරූපි වෙති. මෝඩයෝ වෙති. අපිරිසිඳු සිත් වේ. මෙතැන් සිට මිථ්‍යාදෘෂ්ටිය විසක් බව දැනගන්න.

මීට මෙතැති,
පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි,
උතුරු තලංගම,
බත්තරමුල්ල.
03.05.2015



# ඥාන පූජා ඇසිරිය

(25.11.2013 බුදු සරණ)

පුර සඳ කිරණ බෝපත් මතට වැටී
පලසක් බඳුව ඇත සෙවනැලි මළුවේ වැටී
සතර අතින් එන බැතියන් දණින් වැටී
සතර දිගට දල්වයි හැම පහන් වැටී


නගමින් බැති දනා පඬි පෙළ පේලි යට
බැතියෙන් සාදු හඬ නංවයි එක දිගට
පිරිකර, බුදු පිළිම, ඔසු පැන් ගෙන ඇත ට
ඇත ගස්වනායුරු පිය දසුනකි නෙත ට


බුදුහිමි ඥාන අනුහසයි කියන්නේ
යති නා හිමිඳ ඒ විස්තර කරන්නේ
පාලි පාඨ තේරුම් කර කියන්නේ
බැතිමත් දනා නිසලව හිඳ අහන්නේ

සමිඳුන් අවට මල් සුවඳයි හමන්නේ
මෙත් සිත් පහන් ඒ සමගයි දැල්වෙන්නේ
සමිඳුන් ඥාන අනුහසයයි ගැයෙන්නේ
ඒ ගුණ අහන්නයි දෙවියන් වඩින්නේ


සුපුන් සඳ කිරණ වැද බෝ මළුව වෙත
මෙත් සිත් සදාලන සෙවනැලි වියන ඇත
සිසිලස විඳ ගමින් ගිම්හිම් නිවා ගත
සමාධියෙන් හැම ඇත බුදුගුණය වෙත

**හිරිකුඹුරේ එන්. ගුණසේකර**









මුද්‍රණය - ගගන ප්‍රින්ටර්ස් - 0719 850 841